මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල - 2021
-------------------------------------------------------------------

**1.** **මූල්‍ය ප්‍රකාශන**
------------------

**1.1** **තත්ත්වාගණනය කළ මතය**
---------------------------------

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
--------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත
  විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07** | | |
| (i) 31 ඡේදය ප්‍රකාරව කාල පරිච්ඡේදයට අදාලව රු. 1,157,299,900 ක පොලී ආදායම සහ රු. 1,307,590,803 ක මුදලින් ලද පොලිය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනම හෙළිදරවු කල යුතු වුවත් භාර අරමුදල විසින් එසේ දක්වා නොතිබුණි. | කාලඡේදයට අදාල මුදලින් ලද පොලී මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අදාල ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ii) භාර අරමුදල සතු පිරිවැය රු.772,000ක් වූ දේපළ පිරියත හා උපකරණ, වෙළඳ අමාත්‍යාංශය වෙත පිරිවැය අගයට හුවමාරු කර තිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දේපළ පිරියත හා උපකරණ විකුණුම් ලාභ ලෙස රු.772,000ක වටිනාකමක් දක්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| **(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08** | | |
| 49 වන ඡේදය ප්‍රකාරව අස්ථිත්වය විසින් පෙර වර්ෂවලට අදාලව ගැලපුම් සිදුකිරීමේදී ඊට අදාල ගැලපීම් | මෙය මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කළ යුතු වුවත් භාර අරමුදල විසින් ගලපන ලද එකතුව රු.157,863,504ක් වූ පෙර කාල පරිච්ඡේදයට අදාල ගැලපුම්, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර ගලපන ලද එකතුව සම්බන්ධ උප ලේඛනයක් හෝ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40**<br>06 ඡේදය ප්‍රකාරව ආයෝජන වත්කම් වර්තමාන අගයට තක්සේරු කර දැක්විය යුතු වුවත් 2005 වර්ෂයේදී රු.12,460,179ක් ලෙස ගිණුම්ගත කර තිබූ භාර අරමුදල සතු මාලබේ පිහිටි අක්කර 25ක ඉඩම සමාලෝචිත වර්ෂය වන විටත් වර්තමාන අගයට තක්සේරු කර පොත්වලට ගෙන නොතිබුණි. | SLIIT ආයතනය පාලන මණ්ඩලය වත්කම් සඳහා තක්සේරු වාර්තාවන් ලබාගැනීමට පහසුකම් නොසැපයීම මත සමාලෝචිත වර්ෂයේ වත්කම් වර්තමාන අගයට ගිණුම් වල ගැලපීමට නොහැකිව ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) ජනාධිපති අරමුදලින් ලද සනාථන අනුව 2021 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබිය යුතු ලාභ කොටස රු.1,263,928,947 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශන වල එය රු. 1,230,000,000 ක් ලෙස, රු.33,928,947 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මුළු ලාභය තුළ ශුද්ධ ලොතරැයි ආදායම සහ ලබා නොගත් තෑගි මුදල්ද ඇතුලත් වේ. එම ලාභ නොගත් තෑගි මුදල් ජනාධිපති අරමුදලට බැර කරන අතර එහි 50%ක කොටස මහපොළ අරමුදලට බැර නොකරයි. ඒ අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආදායම් වාර්තා අනුව ඇති මුළු ලාභයෙන් 50%ක කොටස මහපොළ අරමුදලට නොලැබේ. ඒ අනුව දක්වා ඇති වෙනස ලබා නොගත් තෑගි මුදල් වල කොටස වේ. | නිවැරදි ලාභ කොටස තහවුරු කරගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලන සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මේ පිළිබඳව කෝප් කමිටුවේ දි සාකච්ඡා කල අතර 2019 වර්ෂයේ සිට ඒකාබද්ධ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කරන ලෙස දන්වන ලදි. ඒ අනුව ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරිම සඳහා විගණන සමාගමකට භාරදී තිබූ අතර 2019 වසරේ සිට මෙම සමාගම් 2 ඇවර කිරිමට තීරණය කර තිබීමත් නිසා මහපොළ අරමුදලේ ගිණුම් හා එම සමාගම් 2හි ගිණුම් වෙන වෙනම | කෝප් කමිටුවේ නිර්දේශ පරිදි ඒකාබද්ධ ගිණුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | විගණන සඳහා ඉදිරිපත් කොට අවසන් වාර්ෂික වාර්තාද 2020 වර්ෂය දක්වා අඛණ්ඩව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කොට ඇත. | |
| (ඇ)2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර සඳහා රු.219,431,931ක් වූ ලැබිය යුතු පොලී ආදායම මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) පරිපාලිත සමාගම් වෙතින් පවරා ගත් කාර්යාල උපකරණවලින් කොටසක් වෙළඳ අමාත්‍යාංශය වෙත පැවරීම වෙනුවෙන් අරමුදල වෙත ලැබිය යුතු මුදල රු.1,021,450 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.772,000 ක් ලෙස, රු.249,450 ක් අඩුවෙන් වෙනත් ලැබිය යුතු දෑ යටතේ දක්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ලැබිය යුතු මුදල් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ)මිහින්තලේ නගර ව්‍යාපෘතියෙහි වීඩියෝ වාර්තාව සඳහා පෞද්ගලික ආයතනයක් වෙත ගෙවූ රු.870,000ක් ගමන් වියදම් ගිණුමට හර කර තිබුණු අතර ඒ අනුව මිහින්තලේ නගර ව්‍යාපෘතියට අදාළ වියදම රු.870,000ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඊ) 2021 දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් ශේෂ හා මූල්‍ය ප්‍රකාශනවලට අනුව මෝටර් වාහන ශේෂය හා ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය අතර රු.5,100,000 ක් බැගින් වූ වෙනසක් පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | වෙනස්කම් සසඳා නිවැරදි වටිනාකම හඳුනාගත යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමුපකාර තොග වෙළඳ සංස්ථා (ස.තො.ස) ගොඩනැගිල්ල කුලී පදනම මත භාවිතා කිරීම හේතුවෙන්, අරමුදල විසින් ස.තො.ස වෙත ලබා දෙන ලද රු.348,810 ක ආපසු ගෙවනු ලබන කුළී තැන්පතුවක්, එම ගොඩනැගිල්ලෙන් ඉවත් වී වර්ෂ 05ක් ගතවීමෙන් පසුවද ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 348,810 මුදල නැවත අයකර ගැනිම සඳහා වරින් වර ලිපි හා ඊට අදාල බැංකු ප්‍රකාශන යවා ඒ සම්බන්ධව ක්‍රියා කලද තවම මුදල අප වෙත ලබා දිමට සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව කටයුතු කර නොමැත. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රඳවා තබාගත් රු. 3,832,875ක මුදලක් 2013 වර්ෂයේ සිට මේ දක්වා වර්ෂ 08 ක කාලයක් තුල නොවෙනස්ව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල පියවීමට අදාල බිල්පත් හා ඊට අදාල වැඩ නිම කිරීම් වලට අදාල වාර්තා කොන්ත්‍රාත්කරුවන් විසින් මෙතෙක් ඉදිරිපත් කොට නැත. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු සහ ණය හිමියන්ගේ බිල්පත් ඉදිරිපත් කොට නැති බැවින් ගෙවීම් කිරීමට නොහැකි වී ඇත. | ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,292,729,814 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,085,347,967 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 207,381,847 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.338,463,816කින් (සියයට 24කින්) සෘජු වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට ඇත. | ක්‍රියාකාරී සැලසුම් වාර්ෂිකව පිළියෙල කළ යුතු වේ. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 සැප්තැම්බර් 21 දින සිට 2022 සැප්තැම්බර් 20 දින දක්වා වූ මාස 60 ක ගිවිසුම්ගත කාලසීමාවකට අදාලව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මාසිකව රු. 132,500 ක වැට් රහිත මිලකට මාසයක් තුළ කිලෝ මීටර 3000 ක් ධාවනය කිරීමේ පදනම මත අරමුදල | කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් තාවකාලිකව කාර්යාලය වසා දැමීම හේතුවෙන් වසර 2 ½ තුළ ධාවනයක් සිදු | වාහනවල අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගැනීමෙන් පසුව පමණක් කල්බදු |

| | | |
|---|---|---|
| මඟින් පෞද්ගලික ආයතනයක් වෙතින් වෑන් රථයක් ලබා ගෙන තිබුණි. කෙසේ වෙතත් අදාළ වෑන් රථය අත්පත් කරගෙන මාස 51 ක් ගත වී තිබුණු අතර එම කාල පරිච්ඡේදය තුළ වැය කළ මුදලට මසකට කිලෝ මීටර 3,000 ක් බැගින් කිලෝ මීටර 153,000 ක් ධාවනය කිරීමට හැකියාව තිබියදී, කිලෝ මීටර 116,456 ක් පමණක් ධාවනය කර තිබුණු බැවින් අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව ලබා ගත් එම වෑන් රථය, අවම ධාවන දුර ප්‍රමාණයවත් සම්පූර්ණ නොකොට, කිලෝ මීටර 36,544 ක් අඩුවෙන් ධාවනය කිරීම හේතුවෙන් භාර අරමුදලට රු.2,381,762 ක මූල්‍යාමය පාඩුවක් ඇතිවී තිබුණි. | නොවිය. එලෙස මොටර් රථය ධාවනය නොවීම හේතුවෙන් දළ වශයෙන් රු. ලක්ෂ 4ක පමණ ඉන්ධන පිරිවැයක් අරමුදලට ඉතිරියක් වී ඇත. | ගිවිසුම්වලට එළඹිය යුතු වේ. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජනවාරි 08 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී ලබා දුන් පහත නිර්දේශ මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.<br>(i) අරමුදලේ භාරකාර මණ්ඩලය සඳහා සාමාජිකයන් පත්කර තිබුණු නමුත් සභාපතිවරයෙකු පත් කිරීම සඳහා අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර තිබුණ ද, මේ දක්වා පත් කර නොතිබුණි. | භාර අරමුදලේ පනත සංශෝධිත ගැසට් පත්‍රය 2022 ජනවාරි 14 වන දින ප්‍රකාශයට පත් කළ අතර සභාපතිවරයා පත් කිරීම සම්බන්ධයෙන් අදාල ඉල්ලීම මේ වන විටත් වෙළඳ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. රටේ පවතින තත්වය යටතේ තරමක් ප්‍රමාද වී ඇත. | කෝප් කමිටු නිර්දේශ කඩිනමින් ක්‍රියාවට නැංවීම සඳහා අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව කටයුතු කළ යුතුය. |
| (ii) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් සියයට 50 ක කොටසක් භාර අරමුදල වෙත ලැබෙන පරිදි සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත සංශෝධනය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මෙතෙක් සිදුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා කෙටුම්පත් සකස් කොට ඉදිරිපත් කිරීමට කටයුතු කළ අතර ඒ සඳහා වෙළඳ අමාත්‍යවරයාගේ හා ජනාධිපති අරමුදලේ අනුමැතිය තවම ලබා දී නොමැත. | කෝප් කමිටු නිර්දේශ කඩිනමින් ක්‍රියාවට නැංවීම සඳහා අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව කටයුතු කළ යුතුය. |
| (iii) මංගත ලොතරැයිය සම්බන්ධයෙන් සිදු වූ මූල්‍යාමය වංචාව පිළිබඳව අභ්‍යන්තර විමර්ශනයක් සිදු කරන ලෙස උපදෙස් ලබා දී තිබුණද එම විමර්ශනය මේ දක්වා නිම කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ලොතරැයිකරු විසින් ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු රු.මි.750ක් හා එයට අදාළ නෛතික පොලිය අයකර ගැනීම සඳහා එන්තරවාසි (letter of demand) යවා ඇති අතර ලොතරැයිකරු විසින් ගිවිසුම් ප්‍රකාරව බේරුම්කරණය සඳහා බේරුම්කාර මණ්ඩලයක් පත් කොට, මහපොළ අරමුදලට ලැබිය යුතු රු.මි. 750ක් හා ඒ මත නෛතික පොලිය අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | භාර අරමුදල වෙත ලැබිය යුතු මුදල කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන සැලැස්මට අනුව මහපොළ කාර්යාල සංකීර්ණය වෙනුවෙන් අතිරේක ඉඩක් ප්‍රසම්පාදන කිරීම වෙනුවෙන් රු.500,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද, එහි දැන්වීම් ප්‍රචාරණය සඳහා පමණක් සමාලෝචිත වර්ෂය තුළදී රු.859,305ක වියදමක් දරා තිබුණු අතර, ප්‍රචාරණය සඳහා<br>රු.300,000 ක් ප්‍රතිපාදනය කර තිබියදී ප්‍රචාරණ කටයුතු හා පුවත්පත් දැන්වීම් පල කිරීම සඳහා රු.804,978 ක් වැය කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන සැලස්ම නිවැරදිව පිළියෙල කළ යුතු අතර එය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගත යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාර අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය 31 ක් වුවද 2021 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 13 ක් වූයෙන් තනතුරු 18 ක් පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 කින්ද ද්විතීයිය මට්ටමේ තනතුරු 06කින් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 කින්ද සමන්විත වී තිබුණි. සමාලෝචිත වර්ෂය වන විටත් එම පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණු අතර 2022 අප්‍රේල් වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 න් 02 ක් සම්පූර්ණ කර තිබුණි. | භාර අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය 31 වුවද අරමුදලේ පවතින ඉඩ පහසුකම් හා අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන අදාළ බඳවා ගැනීම් සිදු කරන අතර රජයේ චක්‍රලේඛ අනුව බඳවා ගැනීම් සීමා කොට ඇති බැවින් සියලු පුරප්පාඩු පිරවීම ප්‍රායෝගික නොවේ. ද්විතීයික මට්ටමේ පුරප්පාඩු තනතුරු 4ක් සඳහා බඳවා ගැනීමට අනුමැතිය භාරකාර මණ්ඩලය ලබා දී ඇති අතර එයට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. තවද, දැනට පවතින පුරප්පාඩු ආවරණය කිරීම සඳහා ද්විතීයික මට්ටමේ තනතුරු වලට සහය වීම සඳහා වෘත්තිය පුහුණු ආයතන වලින් පුහුණුවන්නන් බඳවා ගැනීම දිගටම සිදු කරනු ලබයි. | අරමුදලේ අවශ්‍යතා ඉටුකර ගැනීමට අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය හෝ බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |